**සමස්ත ලංකා ශාසනාරක්ෂක මණ්ඩල අරමුදල - 2017**

**-------------------------------------------------------------**

සමස්ත ලංකා ශාසනාරක්ෂක මණ්ඩල අරමුදලේ 2017 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් වියදම් ගිණුම, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, අරමුදල් වෙනස් වීමේ ප්‍රකාශනය සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2014 අංක 16 දරන සමස්ත ලංකා ශාසනාරක්ෂක මණ්ඩල පනතේ 10(3) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2014 අංක 16 දරන සමස්ත ලංකා ශාසනාරක්ෂක මණ්ඩල පනතේ 11(1) වගන්තිය ප්‍රකාර අරමුදලේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

**1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම**

**-------------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙළ කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

**1.3 විගණකගේ වගකීම**

**----------------------**

උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000 - 1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව පවත්වනු ලබන විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ.

**1.4 මතය ව්‍යාචනය සඳහා පදනම**

**-------------------------------**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවල ප්‍රතිඵලයක් ලෙස ශේෂ පත්‍රයේ, ආදායම් වියදම් ගිණුමේ මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ සහ අරමුදල් වෙනස්වීමේ ප්‍රකාශනයේ වාර්තාගත වූ හෝ වාර්තාගත නොවූ හෝ විෂයයන් සහ මූලිකාංගවලට අදාළව කවර හෝ ගැලපීම් කිරීමේ අවශ්‍යතාවයක් තිබුණේදැයි තීරණය කිරීමට මට නොහැකිය.

**2. මූල්‍ය ප්‍රකාශන**

**---------------**

**2.1 මතය ව්‍යාචනය**

**-----------------**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු හේතුවෙන් විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් සහ උචිත විගණන සාක්ෂි ලබා ගැනීමට මට නොහැකි විය. ඒ හේතුකොට ගෙන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මම මතයක් ප්‍රකාශ නොකරමි.

## 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 2.2.1 විගණනය සඳහා සාක්ෂි නොවීම

2017 වර්ෂයේ දහම් පාසල් කොඩි දිනය නිමිති කරගෙන මුද්‍රණය කරන ලද රු.25 බැගින් අලෙවිකරන ලොකු කොඩි 49,400 ක් හා රු.10 බැගින් අලෙවි කරන කුඩා කොඩි 926,600 ක් ලෙස රු. 10,501,000 ක් අගයක කොඩි ශාසනාරක්ෂක බල මණ්ඩල 191 ක් සඳහා බෙදා හැර තිබුණි. ශාසනාරක්ෂක බල මණ්ඩල වෙත ලබා දෙන ලද එම කොඩි දහම් පාසල් වෙත බෙදා හැරීමේ තොරතුරු සමස්ත ලංකා ශාසනාරක්ෂක මණ්ඩල අරමුදල සතුව නොතිබුණ අතර ප්‍රාදේශීය ශාසනාරක්ෂක බල මණ්ඩල වල කොඩි අලෙවි කිරීමේ වාර්තා අරමුදල වෙත ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි. මේ හේතුවෙන් 2017 වර්ෂයේ කොඩි අලෙවි ආදායම ලෙස මූල්‍ය ප්‍රකාශන වල දක්වා ඇති රු. 5,442,172 ක අගයෙහි නිවැරදිතාවය විගණනයේදී සතුටුදායක ලෙස තහවුරු කර ගැනීමට නොහැකි විය.

## 2.3 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 395(ඇ) ප්‍රකාරව බැංකු ගිණුමක් ඇති සෑම ආයතනයක් විසින්ම එක් එක් මාසය අවසානයේදී ඇති ගනුදෙනු සම්බන්ධයෙන් ඊළඟ මාසයේ 15 වෙනි දිනට පෙර බැංකු සැසඳුම් ප්‍රකාශනයක් පිළියෙල කලයුතු වුවත් අරමුදල විසින් බැංකු ජංගම ගිණුම සඳහා බැංකු සැසඳුම් ප්‍රකාශ සකස් කර නොතිබුණි.

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵලය

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා අරමුදලේ ඌනතාවය රු.317,489 ක් වූ අතර ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.9,644,078 ක් වූයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයේ රු.9,961,567 ක පිරිහීමක් විය. ඉකුත් වර්ෂයට සාපේක්ෂව කොඩි අලෙවි ආදායම රු.4,493,263 කින් අඩුවීම සහ සමාලෝචිත වර්ෂය තුල පරිත්‍යාග නොලැබීම මේ සඳහා ප්‍රධාන ලෙස බලපා තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

### 4.1 කළමනාකරණ ක්‍රියාකාරකම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) බෞද්ධ කටයුතු දෙපාර්තමේන්තුවේ දත්ත වලට අනුව සමාලෝචිත වර්ෂය වන විට දිවයිනේ සමස්ත දහම් පාසල් ශිෂ්‍ය සංඛ්‍යාව මිලියන දෙක ඉක්මවා ඇත. මුළු ශිෂ්‍ය සංඛ්‍යාවෙන් අඩකටත් වඩා අඩුවෙන් ලෙස සමාලෝචිත වර්ෂය තුල මුද්‍රණය කර තිබූ රු.10,501,000 ක අගයක 976,000 ක් වූ කොඩි ප්‍රමාණයෙන්ද අලෙවි කර ගැනීමට හැකිව පැවතියේ රු.5,442,170 ක් වටිනාකමැති කොඩි පමණක් විය. තවද කොඩි දිනය නිමිත්තෙන් කිසිදු ප්‍රචාරාත්මක වැඩ සටහනක් ක්‍රියාත්මක කිරීමටද අරමුදල පියවර ගෙන නොතිබුණි.

(ආ) ස්වාමීන් වහන්සේලාගේ දෙමාපියන්ට උපකාර කිරීමේ අරමුණින් "බුදු පුත් මාපිය භාරය" ලෙස අරමුදලක් පිහිටුවා පැවතියද අරමුදලින් අපේක්ෂිත කාර්යයන් ප්‍රමාණවත් පරිදි සිදු නොවීම හේතුවෙන් සමාලෝචිත වර්ෂය අවසානය වන විට එකී අරමුදලේ ශේෂය රු.7,247,312 ක් දක්වා වර්ධනය වී තිබුණි.

## 5. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

### 5.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2006 දෙසැම්බර් 22 දිනැති අංක පීඑෆ්/423 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 4.3 ඡේදය ප්‍රකාරව ගිණුම් වර්ෂය අවසන් වී මාස 2 ක් ඇතුළත මූල්‍ය ප්‍රකාශන විගණකාධිපති වෙත ඉදිරිපත් කළයුතු වුවත් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන විගණකාධිපති වෙත ඉදිරිපත් කර තිබුණේ 2018 අගෝස්තු 30 දින දීය.

### 5.2 ක්‍රියාකාරි සැලැස්ම

2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය අනුව සමස්ත ලංකා ශාසනාරක්ෂක මණ්ඩල පනතේ සඳහන් අරමුණු ලඟාකරගත හැකි වන ආකාරයට සමාලෝචිත වර්ෂය සඳහා ක්‍රියාකාරි සැලැස්මක් සකස් කළ යුතු වුවත් එපරිදි කටයුතු කර නොතිබුණි.

### 5.3 අභ්‍යන්තර විගණනය

මුදල් රෙගුලාසි 133 (ආ) සහ 2009 ජුනි 09 දිනැති අංක ඩීඑම්ජ්/2009 (1) දරන විගණන හා කලමනාකරණ චක්‍රලේඛයේ 03 ඡේදය ප්‍රකාර අරමුදලේ අභ්‍යන්තර විගණනයක් සිදු කළ යුතුව තිබුණද සමාලෝචිත වර්ෂය තුළ එසේ සිදුකර නොතිබුණි.

## 6. පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂණය වු පද්ධති හා පාලන දුර්වලතාවයන් වරින්වර අරමුදලේ ගරු සභාපතිගේ අවධානයට යොමුකරන ලදී. පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුය.

| | ක්ෂේත්‍රය | නිරීක්ෂණ |
|---|---|---|
| (අ) | සැලසුම්කරණය | පනතේ සඳහන් අරමුණු ලඟාකරගත හැකි වන ආකාරයට වර්ෂය සඳහා ක්‍රියාකාරි සැලැස්මක් සකස් කර නොතිබීම. |
| (ආ) | දහම් පාසල් කොඩි මුද්‍රණය හා විකිණීම | මුද්‍රණය කරන ලද කොඩි සඳහා අනු අංක යොදා නොතිබීම හා, නොවිකිණි ඉතිරි වූ කොඩි ආපසු භාර ගැනීම, වාර්තා කිරීම, ලද හා ලැබිය යුතු ආදායම් නිවැරදිව ගණනය කිරීම සඳහා ක්‍රමවේදයක් නොතිබීම. |